දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..............................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය'
බත්තරමුල්ල.
"இசுருபாய"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எனது இல. / My No. ED/04/60/01/2017 වා.ස්.මා.

දිනය / திகதி / Date 2016.07.15

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරු,

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (ජාතික පාසල්) ස්ථාන මාරු පරිපාටිය - 2017</u>**

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ බලතල පැවරීම අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ජාතික පාසල්හි සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් සඳහා 2017 වර්ෂයට සැකසූ ස්ථාන මාරු පරිපාටිය මේ සමග එවමි. එය http:/www/moe.gov.lk වෙබ් අඩවියේ ද පළකර ඇත.

02. එම ස්ථාන මාරු පරිපාටිය අනුව ජාතික පාසල්හි සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන් දැනුවත් කර අයදුම්පත් කැඳවා පහත පරිදි ලේඛන සකස් කර 2016.08.31 දිනට හෝ ඊට පෙර අප වෙත එවීමට කටයුතු කළ යුතුය.

- ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍රය ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./01 මගින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
- ඉහත පරිදි ලැබෙන සියලුම ස්ථාන මාරු අයදුම්පත් ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./02 ආකෘතිය අනුව උප ලේඛනගත කර අදාළ පාසලේ විදුහල්පති විසින් කලාප අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.
- එක් සේවා ස්ථානයක අවු. 05 කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ තොරතුරු ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./03 අනුව උප ලේඛනගත කර අදාළ පාසලේ විදුහල්පති විසින් කලාප අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.

03. මෙම සියලු අයදුම්පත් සහ ආකෘති පත්‍ර පළාත් අධ්‍යක්ෂ විසින් 2016.08.31 දිනට ප්‍රථම පහත ලිපිනයට එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව අවධාරණය කරමි.

සහකාර ලේකම් (විදුහල්පති)
විදුහල්පති ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

ඩබ්.එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 2784807 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය" බත්තරමුල්ල.
"இசுருபாயா" பத்தரமுல்லை.
"Isurupaya" Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ED/04/60/01/2017 වා.ස්.මා.

දිනය / திகதி / Date } 2016.07.15

පළාත් අධ්‍යාපන ලේකම්,

..........................................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

..........................................................

**<u>ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථාන මාරුවීම්</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ස්ථාන මාරු චක්‍රලේඛ අංක 22/2016 අනුව 2017 වර්ෂය සඳහා ජාතික පාසල් අතර, විදුහල්පති ශ්‍රේණිධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට නියමිත අතර, ඊට සමගාමීව පළාත් පාසල්වල සිට ජාතික පාසල්වලට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් (ශ්‍රී ලං.වි.සේ. 3 පන්තිය හැර) ඔබ පළාතේ සිටී නම් ඒ සඳහා අවස්ථාව ලබාදීමට මේ සමග එවනු ලබන ඇමුණුම 1 හි සඳහන් ආකෘතිය අනුව අයදුම්පත් සම්පූර්ණ කර එවන ලෙස ඔබ පළාතේ සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් දැනුවත් කර එසේ ලැබෙන අයදුම්පත් ඇමුණුම 2 හා 3 හි සඳහන් ආකෘති අනුව වගුගත කර එම සියලු තොරතුරු 2016.08.31 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ ඔබගේ නිර්දේශ ද සමග එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරන බවද කාරුණිකව දන්වමි

සහකාර ලේකම් (විදුහල්පති)
විදුහල්පති ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. තවද මෙම ඉල්ලීම් අනුව ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමේදී එම නිලධාරීන් සඳහා අනුප්‍රාප්තිකයින් ලබාදෙන බැවින් අදාල නිලධාරීන් එම අවස්ථාවේදී පළාත් රාජ්‍ය සේවයෙන් නිදහස් කළ යුතු බව ද දන්වා සිටිමි.

ඩබ්.එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය.

පිටපත - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - .............................................. - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා

දුරකථන/தொலைபேசி இல./Telephone Nos.
අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 2784807 2785617
ලේකම් / செயலாளர் / Secretary } 2784812
කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846
ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
"ඉසුරුපාය" බත්තරමුල්ල.
"இசுருபாயா" பத்தரமுல்ல.
"Isurupaya" Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

මගේ අංකය / எமது இல. / My No. } ED/04/60/01/2017 වා.ස්.මා.

දිනය / திகதி / Date } 2016.07.

චක්‍රලේඛ අංකය - 22/2016

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු
ජාතික පාසල් විදුහල්පතිවරු

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (ජාතික පාසල්) ස්ථානමාරු පරිපාටිය - 2017**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි ජාතික පාසල්හි සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් සඳහා මෙම ස්ථානමාරු පරිපාටිය ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ස්ථාන මාරු සිදු කරන ආකාරය පහත දැක්වේ.

(අ) වාර්ෂික ස්ථාන මාරු

ස්ථානමාරුවීම් අපේක්ෂා කරන නිලධරයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථානමාරු මණ්ඩල ක්‍රියාත්මක කෙරේ.

(ආ) වාර්ෂික නොවන ස්ථාන මාරු

වාර්ෂික ස්ථාන මාරුවලට අමතරව දෛනික කාර්යයක් ලෙස ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොකරන අතර සේවා අවශ්‍යතාවය සහ විනය හේතු මත අදාල පත්වීම්/විනය බලධරයා විසින් ස්ථානමාරු නියෝග නිකුත් කරනු ලැබේ. මීට අමතරව සුහද ස්ථානමාරු ඉල්ලීම්ද නිලධරයන්ගේ සානුකම්පිතව සළකා බැලිය යුතුවූ සහ හදිසි ඉල්ලීම් ආයතන ප්‍රධානියාගේ නිරීක්ෂණ සහ නිර්දේශ සහිතව ඉදිරිපත් කරන විට ඒ පිළිබඳව සළකා බලා අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

2. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත්වන නිලධරයන්

2.1. විදුහල්පතිවරුන් වශයෙන් කටයුතු කරන නිලධරයන්ද ඇතුළුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන්ද කිසියම් පාසලක අවම වශයෙන් වසර 03 ක් වත් සේවය කර තිබීම ස්ථාන මාරුවීමක් සඳහා අයදුම්කිරීමට සුදුසුකමක් වේ.

2.2. යම් පාසලක අඛණ්ඩව වසර 06 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම නිලධරයන් ස්ථාන මාරුවීම්වලට යටත්වේ.

2.3. ස්ථාන මාරු ඉල්ලුම් කරන හා ස්ථාන මාරුවලට යටත්වන නිලධරයන් තමන් අනුයුක්තවීමට කැමති ස්ථාන තුනක් සඳහන් කරමින් ස්ථාන මාරුවීම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. එසේ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළහොත් එහි සඳහන් ස්ථානයට මාරුවීම ලබාදීමට උත්සාහ දරන අතර ඉල්ලා ඇති ස්ථානයට මාරුවීම ලබාදීමට නොහැකි වුවහොත් මාරුවීම් මණ්ඩලය අභිමතය පරිදි ඔවුන්ට වෙනත් පාසලක් ලබා දෙනු ඇත.

2.4. ස්ථාන මාරුවීම් ලබා දීමේදී එකම පාසලක වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන්ගේ සේවා කාලය අවරෝහණ පිළිවෙලින් ගණනය කර ඒ අනුව පිටතට මාරුවීම් ලබා දේ.

2.5. භාර්යාව සහ ස්වාමි පුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබාදීමට මාරු මණ්ඩල සෑම උත්සාහයක්ම දැරිය යුතුය.

2.6. වාර්ෂික ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධරයන්

(අ) නිලධරයාගේ ඉල්ලීම හෝ වෙනත් විශේෂිත කරුණු මත (විනය හා සේවා අවශ්‍යතාවය) මිස නැත්නම් සාමාන්‍ය වශයෙන් වයස අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් කලාපයෙන් පිටතට මාරු නොකළ යුතු අතර කලාපය ඇතුළත ස්ථාන මාරු කළ හැක. නමුත් විනය හා සේවා අවශ්‍යතාවය මත පාසලේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන අභිවෘද්ධිය පෙරදැරි කරගෙන මෙම නිලධරයන්ටද ස්ථානමාරුවීම් ලබාදිය හැක.

(ආ) නියමිත වර්ෂයේ පෙබරවාරි 28/29 දිනට වයස අවුරුදු 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි කලාපය තුල වුවද මාරු නොකල යුතුය.

2.7. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශ ගතව සිටින අවස්ථාවන්හි වැනි පිළිගත හැකි කරුණු සහිතව තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / පාසල් ප්‍රධානියාගේ නිර්දේශයන්ද සමග ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතුය.

2.8. අති දුෂ්කර / දුෂ්කර / ප්‍රියමනාප නොවන පාසල්වල සේවය සඳහා නිලධරයන් තෝරාගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන්ද පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන්ද හැකි සෑම අවස්ථාවේදීම තෝරා ගැනීමට සැලකිලිමත් විය යුතුය.

2.9. යම් කිසි ලියාපදිංචි වෘත්තීය සමිතියක මව් සංගමයේ සභාපති/ලේකම්/භාණ්ඩාගාරික හා මධ්‍යම විධායක මණ්ඩලයේ සභිකයින් මාරු කරන්නේ නම් අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශය සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන ස්ථානයකට මාරු කළ යුතුය. මෙම ස්ථාන මාරු කිරීම් කාර්ය පටිපාටියේදී වෘත්තීය සංගමය යනුවෙන් හැඳින්වෙන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවාවේ නිලධරයන්ගෙන් සමන්විත වෘත්තීය සමිති වේ. ආයතන සංග්‍රහයේ xxv පරිච්ඡේදයේ 7 වගන්තිය යටතේ වන අනුග්‍රහයන් ලබා ගැනීමට අපේක්ෂා කරන සියළුම වෘත්තීය සමිති තම වෘත්තීය සමිති නිලධරයන් පිළිබඳ විස්තර 5:15 වගන්තියේ ප්‍රකාර අදාළ මාරුවීම් බලධාරියා වෙත මාරු වීම් මණ්ඩල කටයුතු කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

3. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය

වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ කාර්යභාරය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට සහ මෙම ස්ථාන මාරු පටිපාටියේ දැක්වෙන කරුණුවලට යටත්ව 206 හා 207 වගන්තිවලට අනුව ක්‍රියා කරමින් ඉහත (1).අ. ඡේදයේ සඳහන් අවස්ථාවලදී අධ්‍යාපන ලේකම්ට නිර්දේශ ලබාදීම මාරු කමිටුවල කාර්යභාර්ය වේ.

3.1. පහත සඳහන් වාර්ෂික ස්ථානමාරු කමිටු පිහිටුවනු ලැබේ.

(i) ජාතික පාසල් මාරු මණ්ඩලය

3.2. ජාතික පාසල් මාරු මණ්ඩලයේ සංයුතිය

(i) ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ
(ii) සහකාර ලේකම් - විදුහල්පති
(iii) 15% ක නිලධාරී නියෝජනයක් ඇති සෑම විදුහල්පති වෘත්තීය සමිතියකින්ම නම් කළ නියෝජිතයකු

4. වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය

4.1. වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටු සංයුතිය.

(i) මාරු මණ්ඩලය නියෝජනය කරන ලද එක් නිලධාරියකු
(ii) අමාත්‍යංශයේ ලේකම් / අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයකු
(iii) අමාත්‍යංශ ලේකම් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකු

ස්ථානමාරු නියෝගයන් සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා සළකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පිහිටුවිය යුතු අතර එමගින් පහත කරුණු පරීක්ෂා කර තීරණ ලබා දෙනු ඇත.

- මාරු ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධරයන්ගේ ඉල්ලීම්වලට පටහැනි ලෙස කරන ලද මාරුවීම් (මනාප 1, 2, 3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සළකයි)
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනෙන් පසුව නිලධරයන්ට සිදුවූ හදිසි විපත් කරදර අසනීප වැනි සානුකම්පිත තත්ත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් ඒවා පිළිබඳ සළකා බැලීම.

5. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී සැළකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු

5.1. ප්‍රියමනාප / ඉතා ප්‍රියමනාප පාසල්වල සේවය කරන නිලධරයන් විසින් නැවත ප්‍රියමනාප ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සළකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සළකා බැලීමෙන් පසුවය. ප්‍රියමනාප සේවා ස්ථානවල ගතකල කාලය ගණනය කිරීමේදී පූර්වාසන්න වසර 10 තුල සේවය කළ ප්‍රියමනාප සේවා ස්ථාන කිහිපයක වුවද එම කාලයන්ගේ එකතුව ගණන් ගනු ලැබේ.

5.2. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලීසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරිවලදී ආබාධිත තත්ත්වයට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළ යුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි. එසේම එවැනි නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ. මෙවැනි නිලධරයන් ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට ස්ථාන මාරු කිරීමට සිදු වන්නේ නම් ඊට ආසන්නතම පාසලට හෝ නිලධරයාගේ ඉල්ලීමට අනුව අදාළ පාසලට මාරු කළ යුතුය.

5.3. මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී පාසල් කාර්ය මණ්ඩලයේ කණිෂ්ඨ / ජ්‍යෙෂ්ඨතාවයේ සමබරතාවය රැකීමටද හැම විටම උත්සාහ කළ යුතුය.

5.4. වාර්ෂික ස්ථානමාරු පරිපාටියෙහි 2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක, එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එම ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කළ හැක.

5.5. නිලධරයකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව ස්ථාන මාරුවීමක් ලබාදී ඇති විටක එම නිලධරයා විසින්ම එම ස්ථාන මාරුවීම අවලංගු කර ගැනීම සඳහා ඉල්ලීමක් කොට එය අවලංගු කර ගන්නේ නම් (ඉතාම සාධාරණ ඉල්ලීමකට හැර) ඉදිරි වසර 3 ක් දක්වා ඔහුට/ඇයට ස්ථාන මාරුවීම් සඳහා ඇති හිමිකම් අහිමි වේ.

5.6. ප්‍රියමනාප සේවා ස්ථානවල වසර 5 ට වඩා සේවය කළ නිලධරයන්ගේ නාම ලේඛණයක් ඔවුන්ගේ වයස, සේවා කාලය, පදිංචි ප්‍රදේශය, ස්ථානමාරු කළහොත් මාරුවී යාමට වඩාත් කැමති ස්ථාන 3 ක්, යනාදී සියළු තොරතුරු අදාළ ආකෘතියෙන් නිවැරදිව සම්පූර්ණ කර අධ්‍යාපන ලේකම් වෙත ඔවුන් විසින් දන්වනු ලබන දිනට පෙර අදාළ විදුහල්පතිවරුන් විසින් එවිය යුතුය.

5.7. ඒ අනුව එම නිලධරයන් පාසලෙන් පිටතට මාරු කර ඒ හා සම නිලධරයන් සංඛ්‍යාවක් පාසල වෙත ස්ථාන මාරු කිරීමට ඔවුන් විසින් කටයුතු කරනු ලැබේ.

5.8. ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයක සේවය කළ නිලධරයකු ස්ථාන මාරුවීමක් ඉල්ලූ විට එම ඉල්ලීම ඉටු කිරීමට මෙහි 5.6 වගන්තියේ අවශ්‍යතා සපුරා ඇති එකී ස්ථානයේ වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කළ හැක.

5.9. ප්‍රියමනාප සේවා ස්ථානවලට ස්ථාන මාරුවීම් ලබාදීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කළ නිලධරයන්ටය. එමෙන්ම සේවා කාලය හා නිලධරයන් විසින් දැනුම් දී ඇත්නම් ඔවුන්ට ප්‍රායෝගිකව මුහුණදීමට සිදුවන ප්‍රශ්නද සළකා බලනු ලැබේ.

5.10. ස්ථාන මාරුවීම් ඉල්ලීමේදී සහ අභියාචනා ඉදිරිපත් කිරීමේදී සළකා බලනු ලබන්නේ ඒ සඳහා සකස් කර හඳුන්වාදෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රය අනුවම සකස් කළ අයදුම්පත් පිළිබඳව පමණි.

5.11. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානීන් වග බලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු එවා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳව අදාළ ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර ඔවුන් විනයානුකූල කටයුතුවලටද යටත් වේ.

5.12. මාරු කමිටු මගින් අමාත්‍යංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධානවලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීම පිණිස අදාළ බලධරයා වෙත වාර්තා කරනු ලැබේ.

5.13. ස්ථාන මාරුවීම් ලැබූ නිලධරයන් නියමිත දින සිට නව සේවා ස්ථානයේ රාජකාරී කටයුතුවලට වාර්තා කර තිබියදීත් ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාළ නිලධරයන් මුදා හැර නොමැති අවස්ථා වාර්තාවී ඇත. එවැනි අවස්ථා උද්ගත නොවීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු අතර එම නිලධරයන් මුදා නොහරින්නේ නම් තවදුරටත් වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ආයතන ප්‍රධානීන් විසින් වගකීම භාර ගත යුතුය.

5.14. ස්ථාන මාරුවීම් ලැබේ යයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු කල් ඇතුව වෙනත් නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

5.15. ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක් තම පාසල තුල රඳවා ගත යුතු යැයි විදුහල්පති විසින් අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම එම අවශ්‍යතාවය පිළිබඳ පැහැදිලි කර අදාළ පළාත් අධ්‍යක්ෂකගේ නිර්දේශ ඇතිව අධ්‍යාපන ලේකම් වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව මාරු කමිටුවලට ඒ පිළිබඳව දැනුම්දී ක්‍රියා කරනු ඇත. එක් වතාවකදී මෙම අවස්ථාව ලබාදී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

5.16. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හි ii වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

6. වාර්ෂික ස්ථානමාරු කාල සටහන

(i) අයදුම්පත් භාර දිය යුතු අවසාන දිනය :

වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම 2016 ජුනි 30 ට පෙර අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් විසින් නිකුත් කරන අතර මෙහි සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලව සකස් කර වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර විදුහල්පති / කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ජුලි 31 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

(ii) වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් අදාල බලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු දිනය :

2016 අගෝස්තු 31 ට පෙර වාර්ෂික ස්ථාන මාරු යෝජනා අධ්‍යාපන ලේකම් වෙත භාර දිය යුතුය.

(iii) වාර්ෂික ස්ථාන මාරු යෝජනා ලද පසු ස්ථාන මාරු දැන්වීම නිකුත් කළ යුතු දිනය :

2016 සැප්තැම්බර් 15 ට පෙර යෝජිත ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කළ යුතුය.

(iv) වාර්ෂික ස්ථාන මාරු යෝජනා වලට අතෘප්තිමත් නිලධාරීන් සඳහා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 14 වන පරිශිෂ්ඨය අනුව එම ස්ථාන මාරුවලට විරුද්ධව කරුණු දැක්වීම් ආයතන ප්‍රධානීන් වෙත ඉදිරිපත් කිරීමට ලබාදී ඇති කාලය : දින 14

(v) වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීමේ අවසාන දිනය :

2016 සැප්තැම්බර් 30 ට පෙර

(vi) වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් අභිනියෝජිත බලධරයා වෙත නිර්දේශ ලබා දිය යුතු අවසාන දිනය : 2016 ඔක්තෝබර් 15 ට පෙර

(vii) වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කළ යුතු දිනය : 2016 නොවැම්බර් 01 ට පෙර

(viii) වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක කළ යුතු දිනය : 2017 ජනවාරි 01

7. වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

7.1. ස්ථානමාරු පිළිබඳ කරුණු දැක්වීමට අවශ්‍ය නිලධරයන් 14 පරිශිෂ්ඨය ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් තම ඉල්ලීම අභිනියෝජිත බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එහි පිටපතක් සෘජුවම අදාල බලධරයා වෙත අවශ්‍ය නම් ඉදිරිපත් කිරීමටද අදාළ රජයේ නිලධරයාට අවසර ඇත. ස්ථානමාරුවක් ලද විදුහල්පති සේවයේ නිලධරයකු එම ස්ථාන මාරුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කළ අවස්ථාවක එම අභියාචනයට පිළිතුරක් ලැබෙන තෙක් දැනට සේවය කරන පාසලේ සේවය කිරීමට ඉඩ සළසා දිය යුතුය. අභියාචනා මණ්ඩලයේ තීරණය මසක් ඇතුළත අදාළ විදුහල්පතිවරයාට ලබාදිය යුතුය.

7.2. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ ලබාදීමෙන් පසු නැවත සිදු කරනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීතීන්හි XX වන පරිච්ඡේදයේ 230 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

8. නිලධරයන්ගේ වගකීම්

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයන් නියමිත දිනයේදී නව රාජකාරි ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටී.

9. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්යය පටිපාටික රීති 214, 215, 216, 217 වගන්තිවල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

ඩබ්.එම්. බන්දුසේන
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

වි. සේ./වා.ස්.මා./01

# ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථානමාරු සඳහා අයදුම්පත

| තනතුර හා පන්තිය | | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | |
|---|---|---|---|

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම :- | | | |
| 02. මුලකුරු සමග නම :- | | | |
| 03. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) | | | |
| 04. උපන් දිනය :- | 05. වයස :-(2016.12.31 දිනට) අවු ……… මාස…… දින…….. | 06. ජාතික හැඳුනුම්පත් අංකය | 07.ස්ත්‍රී/පුරුෂ |
| 08. ස්ථිර ලිපිනය :- | 09. තාවකාලික ලිපිනය:- | 10. දුරකථන අංකය<br>කාර්යාලයීය :-<br>පෞද්ගලික :- | |
| 11. විවාහක අවිවාහක බව :- | 12. කලත්‍රයාගේ නම :- | 13. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 14. දරුවන් ගණන | 15. ඔවුන්ගේ වයස | 16 ඉගෙනුම ලබන පාසැල :- | |

ආ. සේවා තොරතුරු

| | | |
|---|---|---|
| 17. පත්වීම් ලිපියේ අංකය :- | 18. ස්ථිර කර තිබේද ? | |
| 19. වර්තමාන සේවා ස්ථානය:- | 20. සේවා ස්ථානය පිහිටි කලාපය :- | |
| 21.වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය<br>YYYY/MM/DD (………../….. /….. ) | 22. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (2016.12.31)<br>අවු ………. මාස ………දින ……. | |
| 23 ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර තිබේද ? (ප්‍රියමනාප) | | |

| 24 රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන (ගුරු සේවයද ඇතුළුව) | | සේවා ස්ථානය | සේවා කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |
| | 6 | | | |
| | 7 | | | |
| | 8 | | | |
| | 9 | | | |
| | 10 | | | |

ඇ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු

| 25 | සේවා ස්ථානය | සේවා ස්ථානය පිහිටි නගරය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |

26. ස්ථාන මාරු ඉල්ලුම් කිරීමට හේතු -

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

............................ ....................................
දිනය අත්සන

ඈ. විදුහල්පතිගේ නිර්දේශය

➢ ඉහත නම සඳහන් නිලධාරියාගේ ස්ථාන මාරු ඉල්ලීම අනුප්‍රාප්තිකයෙකු සහිතව/රහිතව/ පසුව ලබා දීමේ පදනම මත නිර්දේශ කරමි.

................................ ................................
දිනය අත්සන
නිල මුද්‍රාව

විදුහල්පති සේවයේ එක් එක් පන්ති සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න (1, 2, 3)

විදු.සේ./වා.ස්.මා/02

වාර්ෂික ස්ථාන මාරුවීම් අයදුම්පත් උපලේඛනය - 2017 වර්ෂය

පාසල ..............................................................................................................

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුරු/ ශ්‍රේණිය හා මාධ්‍යය | උපන් දිනය හා 2016.12.31 දිනට වයස හා ලිපිනය | විවාහක අවිවාහක බව කලත්‍රයාගේ සේවා ස්ථානය | දරුවන් සංඛ්‍යාව හා පාසැල් යන දරුවන් සංඛ්‍යාව | කලත්‍රයා ආරක්ෂක සේවයේ රාජකාරීයේ නියුතු අයෙක්ද ? | සේවා ස්ථානය හා කාල සීමාව | මාරුවීම ඉල්ලීමට හේතු | මාරුවීමට කැමති පාසල | මාරු කමිටුවේ තීරණය (හිස්ව තබන්න) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | |

සියළුම විදුහල්පති ශ්‍රේණිධාරීන්ගේ අයදුම්පත් පිළිබඳ තොරතුරු මෙම ලේඛනයට ඇතුලත් කර ඇති බව සහතික කරමි.

සකස් කළේ නම -                                        අත්සන -

පරීක්ෂා කළේ නම -                                        අත්සන -

දිනය -

.....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

විදුහල්පති සේවයේ එක් එක් පන්ති සඳහා වෙන වෙනම මෙම ආකෘති සම්පූර්ණ කිරීමට කටයුතු කරන්න (1, 2, 3)

විදු.සේ./වා.ස්.මා/03

**එක් සේවා ස්ථානයක අවුරුදු 06 කට වැඩි කාලයක් සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ විස්තර මෙහි අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු බව සලකන්න. (2016.12.31 දිනට)**
**වැඩිම සේවා කාලයක් ඇති නිලධාරීන්ගේ නම් මුලින්ම ඇතුළත් විය යුතු බව සලකන්න.**

පාසල - ........................................................................................................................

| නිලධාරියාගේ නම :- මයා/මිය/මෙය යන්න සඳහන් කරන්න. | විදුහල්පති සේවයේ ස්ථිර පත්වීම් ලිපියේ අංකය | ජාතික හැඳුනුම්පත් අංකය | තනතුරු/ශ්‍රේණිය හා මාධ්‍ය | උපන් දිනය හා 2016.12.31 දිනට වයස හා ලිපිනය | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය 2016.12.31 දිනට | විවාහක අවිවාහක බව කලත්‍රයාගේ සේවා ස්ථානය | පාසැල් යන ළමයින් පිළිබඳ විස්තර | දැනට පදිංචි ප්‍රදේශය හා ලිපිනය(ස්ථිර හා තාවකාලික ලිපිනය) | මුල් පත්වීමේ (ගුරු) සිට සේවා ස්ථාන හා කාලසීමාවන් | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්කර තිබේද ? අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

සකස් කළේ, නම -

අත්සන -

(අ) මෙම පාසලේ අවුරුදු 06 ට වැඩි සේවා කාලයක් ඇති සියලුම නිලධාරීන් පිළිබඳ විස්තර මෙම ලේඛනයට ඇතුළත් කර ඇති බව සියලුම තොරතුරු නිවැරදි බවට සෑහීමට පත්විමෙන් අනතුරුව සහතික කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම් සම්බන්ධයෙන් අදාල විනය නිලධාරියාට වාර්තා කිරීමට සිදුවිය හැකි බව සැළකිල්ලට ගනිමින් සහතික කරමි.

පරීක්ෂා කළේ , නම -

අත්සන -

දිනය -

ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

❖ සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට කලාප/පාසැල් ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය තොරතුරු ඇති බව හෙලිවුවහොත් ඒ පිළිබඳව අදාළ කාලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/විදුහල්පති හා එම ලැයිස්තුව සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර ඔවුන්ට විනයානුකූල කටයුතු වලට ද යටත් වේ.